# අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ඉල්ලීමයි

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය කෘෂිකර්ම, පශු සම්පත්,**
**ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

IWWRMP

# ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

## ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

## (ණය අංකය - IDA-6621-LK)

| කොන්ත්‍රාත්තුවේ නම සහ අංකය | තනතුරු |
|---|---|
| NPC සඳහා තනි පුද්ගල උපදේශකයින් (තාක්ෂණ නිලධාරීන්) බඳවා ගැනීම - ID LK-MOMDE-(512490, 512493-512500)-CS-INDV | 08 |
| NPC සඳහා තනි පුද්ගල උපදේශකයින් (සැලසුම් ශිල්පීන්) බඳවා ගැනීම - ID LK-MOMDE-(512501, 512502, 512504, 512505)-CS-INDV | 04 |
| ජල පෝෂක ප්‍රතිස්ථාපන ක්‍රියාකාරකම් අධීක්ෂණය සඳහා තනි පුද්ගල උපදේශකයින් (සිවිල් ඉංජිනේරුවන්) බඳවා ගැනීම LK-MOMDE-512507, 512512-CS-INDV | 02 |
| ජල පෝෂක ප්‍රතිස්ථාපන ක්‍රියාකාරකම් අධීක්ෂණය සඳහා තනි පුද්ගල උපදේශකයින් (තාක්ෂණ නිලධාරීන්) බඳවා ගැනීම LK-MOMDE-512509, 512514-CS-INDV | 02 |
| IWWRMP සඳහා තනි පුද්ගල උපදේශකයින් (අධීක්ෂණ සහ පරිසර විශේෂඥ) බඳවා ගැනීම LK-MOMDE-524045-CS-INDV | 01 |

01. ශ්‍රී ලංකා රජය වෙත ලෝක බැංකුව වෙතින්, ප්‍රසම්පාදන අස්තිත්වය වන ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියෙහි (IWWRMP) පිරිවැය සඳහා මුදල් යෙදවීමක් සිදු කොට ඇති අතර, ඉන් කොටසක්, උපදේශක සේවා ලබා ගැනීම සඳහා යෙදවීමට අපේක්ෂා කෙරේ.

02. ඒ අනුව, ප්‍රසම්පාදන අස්තිත්වය විසින් යාකොට ඇති යොමු කිරීමේ අනුදේශවල (TOR) සඳහන් සේවා ලබාදීම සඳහා තමන්ගේ අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා තනි උපදේශකයන් වෙත ආරාධනා කෙරේ. එසේ ඉල්ලා ඇති උපදේශක සේවා සඳහා තම සේවය ලබා දීමට කැමැත්තක් දක්වන උපදේශකයන් විසින් තමන්ගේ ජීවදත්ත (CV) ද ඇතුළත් අභිලාෂය ප්‍රකාෂ කිරීම් ඉදිරිපත් කරන ලෙසට ඉල්ලීමක් කෙරේ. (ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය)

03. අදාළ උපදේශකවරයා, තෝරාගත් පසු, IWWRMP ව්‍යාපෘතිය සඳහා අදාළ ලේඛන සකස් කිරීම සඳහා TOR ලේඛනයන්හි සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කිරීම අවශ්‍යවේ.

04. අදාළ උපදේශකවරයාගේ පළපුරුද්ද හා සුදුසුකම්, යොමු කිරීමේ අනුදේශවල ලැයිස්තුගත අවශ්‍යතා සපුරාලිය යුතුය. (මෙම TOR ලේඛනය, වෙබ් අඩවිය වන https://www.iwwrmp.lk/web/procurement/section/procurement-notices හි සඳහන්ව ඇත.) අදාළ ඇගැයුම් කිරීම්, පහතින් විස්තර සඳහන් පරිදි, එක් එක් උපදේශකවරයාගේ සුදුසුකම් හා පළපුරුද්ද මත සිදු කෙරේ.

අ) උපදේශකවරයාගේ අධ්‍යාපනික සුදුසුකම් සහ අතිරේක සුදුසුකම්

ආ) සමස්ත පළපුරුද්ද පැවරුමට අදළ පළපුරුද්ද සහ ලෝක බැංකුව, ADB වැනි විදේශ අරමුදල් සැපයෙන ව්‍යාපෘති හි පළපුරුද්ද

ඇ) කලාපය සහ භාෂාව පිළිබඳ පළපුරුද්ද හෝ සමාන ස්වභාවයේ ව්‍යාපෘති පිළිබඳ පළපුරුද්ද.

05. මෙම අභිලාෂය ප්‍රකාශ කිරීමේ දැන්වීමට ප්‍රතිචාර දක්වනු ලබන අයවළුන් අතරින් තනි උපදේශකවරයා තෝරාගනු ඇත. අදළ අයදුම්කරුවන් අතුරින් වඩාත් පළපුරුද්ද සහිත හා ඉහළ සුදුසුකම් සහිත අයවලුන් අතුරින් අදළ සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව එම ඇගැයුම් කටයුතු සිදු කෙරෙන අතර, එම පැවරුම සාර්ථකව ඉටු කිරීමේ හැකියාව තිබිය යුතුය.

06. අදළ උපදේශකවරයා තෝරා ගැනීම, ලෝක බැංකුවේ, මාර්ගෝපදේශ : 2017 නොවැම්බර් හා 2018 අගෝස්තු මාස වල සංශෝධිත, 2016 ජූලි දිනැති IPF ණය ගැනුම්කරුවන් සඳහා ප්‍රසම්පාදන රෙගුලාසි ප්‍රකාරව **"විවෘත තරගකාරී වශයෙන් තනි උපදේශකවරයකු තෝරා ගැනීම"** අනුව සිදු කෙරේ.

07. ලෝක බැංකුවේ බැඳියා පිළිගැටුම් මත වන ප්‍රතිපත්ති දිශාගත කෙරෙමින් 2017 නොවැම්බර් හා 2018 අගෝස්තු මාසවල සංශෝධිත, 2016 ජූලි දිනැති ලෝක බැංකුවේ IPF ණය ගැණුම්කරුවන් සඳහා වන ප්‍රසම්පාදන රෙගුලාසිවල III කොටසේ 3.14, 3.16 හා 3.17 ඡේද වෙත උනන්දුවක් දක්වන උපදේශකයන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

08. අදළ සේවා ලබාදීමේ ආරම්භක දිනය, 2026 ජනවාරි මාසයේ මැද කොටස ලෙස අපේක්ෂා කෙරේ.

09. අභිලාෂය ප්‍රකාශ කිරීම් සකස් කිරීමේ හා කොන්ත්‍රාත්තුව යටතේ සාකච්ඡා, සඳහා වන පිරිවැය, පැවරුමේ සෘජු වියදම් ලෙස ප්‍රතිපූරණය කිරීමක් සිදු නොකරනු ලබන බව කරුණාවෙන් සලකන්න.

10. උනන්දුවක් දක්වන උපදේශකවරුන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, පහත සඳහන් ලිපිනයේ ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති විශේෂඥ (ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත්) වෙතින්, රාජකාරී දිනවලදී පමණක් 09.00 පැය හා 15.00 පැය අතරතුර කාර්යාල වේලාවන් තුළදී ලබාගත හැක. **දුරකථන. +94112691163, ඊමේල් :** iwwrmp@sltnet.lk

11. කරුණාකර, ඔබගේ ජීව දත්ත ඇතුළත් අභිලාෂය ප්‍රකාෂ කිරීම්, ඊමේල් මගින් හෝ ඉහත ලිපිනය වෙත 2026.12.29 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,**
**ඒකාබද්ධ ජලාධාර හා ජලසම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය,**
**2 වන මහල, මහවැලි මධ්‍යස්ථාන ගොඩනැගිල්ල,**
**අංක 96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07.**
**දුරකථන : +94-112691163**
**2025 දෙසැම්බර් 12 වන දින**